



### චන්ද්‍රිකා දත්ත මත පදනම් වූ

# ටූනා මත්ස්‍යය බිම් පුරෝකතන සේවාව
# ஆழ் கடல் மீன்பிடித் தளங்களுக்கான எதிர்வு கூறல்

---


ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය

கடல்சார் கடல் அறிவியல் தேசிய நிறுவனம் தேசிய நீர்வள
ஆராய்ச்சி அபிவிருத்தி முகாமை




# බහුදින යාත්‍රා සඳහා මසුන් ගැවසෙන ප්‍රදේශ පිළිබඳ පුරෝකථනය
# ஆழ் கடல் மீன்பிடித் தளங்களுக்கான எதிர்வு கூறல்

නිකුත්කල දිනය பிரசுரிக்கப்பட்ட திகதி :

**2022-08-01**

| දේශාංශ நெட்டாங்கு | | | අක්ෂාංශ அகலாங்கு | | | ගැඹුර ஆழம் |
|---|---|---|---|---|---|---|
| අංශක பாகை | මිනිත්තු கலை | | අංශක பாகை | මිනිත්තු கலை | | බඹ பாகம் |
| 82 | 23 | E | 7 | 10 | N | 21 |
| 63 | 42 | E | 5 | 39 | N | 51 |
| 64 | 5 | E | 6 | 22 | N | 51 |
| 63 | 44 | E | 8 | 35 | N | 58 |
| 66 | 38 | E | 8 | 35 | N | 50 |
| 62 | 42 | E | 4 | 19 | N | 52 |
| 61 | 3 | E | -3 | 59 | S | 47 |

0112 520193

WhatsApp 070 272 3990

Service credits: "Generated using E.U. Copernicus Marine Service Information. GMI data are produced by Remote Sensing Systems and sponsored by NASA Earth Science funding

<u>බහු දින යාත්‍රා සඳහා කාලගුණ අනාවැකිය</u>
<u>උතුරු අක්ෂාංශ 20 ත් දකුණු අක්ෂාංශ 10 ත් සහ නැගෙනහිර දේශාංශ 60 ත් 100 ත් අතර මුහුදු ප්‍රදේශය සඳහා</u>

<u>(2022 අගෝස්තු මස 01 දින පෙ.ව. 07.00 ට, ඉදිරි පැය 24 සඳහා නිකුත් කරන ලදි.)</u>

**නිරිතදිග මෝසම් තත්ත්වයේ සක්‍රීය වීමක් අද ( අගෝස්තු 01 වන) දින සිට බලාපොරොත්තු විය හැක. එබැවින් අද දින සිට ඉදිරි දින කිහිපයේදී බස්නාහිර සහ දකුණු මුහුදු ප්‍රදේශවල වැසි සහ සුළං තත්ත්වයේ වැඩිවීමක් බලාපොරොත්තු විය හැක.මේ හේතුවෙන්, උතුරු අක්ෂාංශ 02ත් 07 ත් (02N-07N) නැගෙනහිර දේශාංශ 75ත් 90 (75E-90E) න් මායිම් වන මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය පැ.කි.මී. (40-50) පවතින අතර විටින් විට පැ.කි.මී. (60-70) දක්වා වැඩි විය හැක.**

**ඉහත කී මුහුදු ප්‍රදේශ රළු වන අතර තද වැසි හෝ ගිගුරුම් සහිත වැසිද ඇතිවිය හැක.**

<u>දිවයින වටා වන මුහුදු ප්‍රදේශ</u>

**වැසි තත්ත්වය:**
පුත්තලම සිට කොළඹ සහ ගාල්ල හරහා හම්බන්තොට දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ. දිවයින වටා වන සෙසු මුහුදු ප්‍රදේශ වල තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ
**සුළඟ:**
දිවයින වටා වන මුහුදු ප්‍රදේශවල සුළං බස්නාහිර සිට නිරිත දක්වා දිශාවලින් හමා එයි. සුළගේ වේගය **පැ.කි.මී.** (30-40) පමණ වේ. බේරුවල සිට ගාල්ල, හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය විටින් විට **පැ.කි.මී. (60-70)** දක්වා වැඩි විය හැක. පුත්තලම සිට කොළඹ හරහා බේරුවල දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය විටින් විට **පැ.කි.මී. (50-60)** දක්වා වැඩි විය හැක. පුත්තලම සිට මන්නාරම හරහා කන්කසන්තුරය දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය විටින් විට **පැ.කි.මී. 50** දක්වා වැඩි විය හැක.

**මුහුදේ ස්වභාවය:**
බේරුවල සිට ගාල්ල, හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශ ඉතා රළු වන අතර පුත්තලම සිට කොළඹ හරහා බේරුවල දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශ විටින් විට රළු වේ. පුත්තලම සිට මන්නාරම හරහා කන්කසන්තුරය දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශ විටින් විට තරමක් රළු වේ. දිවයින වටා වන සෙසු මුහුදු ප්‍රදේශ මද වශයෙන් රළු වේ.

**බේරුවල සිට ගාල්ල, හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල මුහුදු රළ උස (මීටර්. 2.5 – 3.5 ක් පමණ) ඉහළ යාමේ හැකියාවක් ද පවතී.**

**එබැවින් බේරුවල සිට ගාල්ල, හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල නැවත දැනුම් දෙන තුරු, ධීවර සහ නාවික කටයුතුවල නොයෙදන ලෙස දැනුම් දෙනු ලැබේ.**

<u>බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශය</u>
**කාලගුණික තත්ත්වය:**

| | |
|---|---|
| 00-10N, 80E-100E | : බොහෝ ස්ථාන වල වැසි හෝ ගිගුරුම් සහිත වැසි. |
| 10N-15N, 85E-100E | : තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි. |
| සෙසු මුහුදු ප්‍රදේශ | : ස්ථාන ස්වල්පයක වැසි හෝ ගිගුරුම් සහිත වැසි. |

**සුළං තත්ත්වය:**

| | |
|---|---|
| 00-07N, 80E-90E | : නිරිත දෙසින් / පැ.කි.මී. (45-55), විටින් විට **පැ.කි.මී. (65-75)** දක්වා. |
| 02N-12N, 90E-100E | : නිරිත දෙසින් / පැ.කි.මී. (30-40), විටින් විට **පැ.කි.මී. (50-60)** දක්වා. |
| සෙසු මුහුදු ප්‍රදේශ | : නිරිත දෙසින් හෝ නිශ්චිත දිශාවකින් තොරව / පැ.කි.මී. (20-30). |

**මුහුදේ ස්වභාවය:**

| | |
|---|---|
| 00-07N, 80E-90E | : රළු සිට ඉතා රළු දක්වා. |
| 02N-12N, 90E-100E | : තරමක් රළු සිට රළු දක්වා. |
| සෙසු මුහුදු ප්‍රදේශ | : මඳ වශයෙන් රළු. |

## අරාබි මුහුද :

**කාලගුණික තත්ත්වය:**

| | |
|---|---|
| 00-10N, 65E-80E | : බොහෝ ස්ථාන වල වැසි හෝ ගිගුරුම් සහිත වැසි. |
| 00-05N, 60E-65E | : තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි. |
| 10N-15N, 70E-75E | : තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි. |
| සෙසු මුහුදු ප්‍රදේශ | : ප්‍රධාන වශයෙන් වැසි රහිත. |

**සුළං තත්ත්වය:**

| | |
|---|---|
| 00-10N, 70E-80E | : බස්නාහිර සිට නිරිත දෙසින් / පැ.කි.මී. (45-55), විටින් විට **පැ.කි.මී. (60-70)** දක්වා. |
| 04N-20N, 60E-70E | : නිරිත සිට බස්නාහිර දෙසින් / පැ.කි.මී. (30-40), විටින් විට **පැ.කි.මී. (50-60)** දක්වා. |
| 10N-20N, 70E-75E | : බස්නාහිර සිට වයඹ දෙසින් / පැ.කි.මී. (30-40), විටින් විට **පැ.කි.මී. 50** දක්වා. |
| සෙසු මුහුදු ප්‍රදේශ | : දකුණ සිට නිරිත දෙසින් / පැ.කි.මී. (20-40). |

**මුහුදේ ස්වභාවය:**

| | |
|---|---|
| 00-10N, 70E-80E | : රළු සිට ඉතා රළු දක්වා. |
| 04N-20N, 60E-70E | : තරමක් රළු, විටින් විට රළු. |
| 10N-20N, 70E-75E | : මඳ වශයෙන් රළු, විටින් විට තරමක් රළු. |
| සෙසු මුහුදු ප්‍රදේශ | : සාමාන්‍ය ස්වභාවයේ සිට මඳ වශයෙන් රළු. |

## දකුණු ඉන්දියානු සාගරය

**කාලගුණික තත්ත්වය**:

| | |
|---|---|
| 00-05S, 75E-95E | : බොහෝ ස්ථාන වල වැසි හෝ ගිගුරුම් සහිත වැසි. |
| 05S-10S, 75E-85E | : තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි. |
| සෙසු මුහුදු ප්‍රදේශ | : ස්ථාන ස්වල්පයක වැසි හෝ ගිගුරුම් සහිත වැසි. |

**සුළං තත්ත්වය:**

| | |
|---|---|
| 00-10S, 75E-90E | : ගිණිකොන සිට නිරිත දෙසින් / පැ.කි.මී. (35-45), විටින් විට **පැ.කි.මී. (55-65)** දක්වා. |
| 02S-10S, 60E-75E | : ගිණිකොන දෙසින් / පැ.කි.මී. (30-40), විටින් විට **පැ.කි.මී. (50-60)** දක්වා. |
| සෙසු මුහුදු ප්‍රදේශ | : නිශ්චිත දිශාවකින් තොරව / පැ.කි.මී. (10-20). |

**මුහුදේ ස්වභාවය:**

| | |
|---|---|
| 00-10S, 75E-90E | : තරමක් රළු සිට රළු, විටින් විට ඉතා රළු දක්වා. |
| 02S-10S, 60E-75E | : තරමක් රළු, විටින් විට රළු දක්වා. |
| සෙසු මුහුදු ප්‍රදේශ | : සාමාන්‍ය ස්වභාවයේ සිට මඳ වශයෙන් රළු. |

**ගිගුරුම් සහිත වැසි ඇති වන විට තද සුළං සමඟ එම මුහුදු ප්‍රදේශ තාවකාලිකව ඉතා රළු විය හැක.

කාලගුණ විද්‍යාඥ
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව.